**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය**

**අති විශෙෂ**

**අංක 1825/1 – 2013 අගෝස්තු 26 වැනි සඳුදා – 2013.08.26**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ, අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩගහපත්තුව සුළු කොට්ඨාසයේ කරස්නාගල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක ගම්/අත්/2012/332 හා 2012.12.26 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අංක 1 ලෙස සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 1.2141ක් පමණ වන ගොරොක්කොටුව වත්ත නමැති ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අංක 1 – ගොරොක්කොටුව වත්ත – ප්‍රමාණය: හෙක්. 1.2141ක් පමණ**

උතුරට සහ නැගෙනහිරට: මෙම ඉඩමේ ඉතිරි කොටස; දකුණට: මාර්ගය (ප්‍රාදේශීය සභා); බටහිරට: මෙම ඉඩමේ ඉතිරි කොටස.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: 4/3/9/2011/ඩබ්ලිව්එස්/167.
2013 ජුලි මස 11 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

09 – 151

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ, කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩගම්පහ කෝරළේ සුළු කොට්ඨාසයේ කුණ්ඩසාලේ ගමේ පිහිටි, මහනුවර කොට්ඨාස භාර සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මහ 4922 හා 2008.11.28 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 1 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.0759ක් පමණ වූ ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අංක 1 – පල්ලෙකැලේවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0759**

උතුරට: මු. පි. මහ 3954 හි කැබලි අංක 15 සහ 16; නැගෙනහිරට: මු. පි. මහ 3954 හි කැබලි අංක 16 සහ කැබලි අංක 02; දකුණට: කැබලි අංක 02 සහ මු. පි. මහ 3954 හි කැබලි අංක 12; බටහිරට: මු. පි. මහ 3954 හි කැබලි අංක 12 සහ 15.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය: 4/3/15/2012/වීඒ/44.
2013 ජුලි මස 26 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

09 – 161

1A – G18166 – 270 (2013/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*